සැ. යු. - 2020.11.13 වැනි දින අංක 2202 දරන ගැසට් පත්‍රයේ II, III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,203 - 2020 නොවැම්බර් මස 20 වැනි සිකුරාදා - 2020.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1974 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1975 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 දෙසැම්බර් මස 11 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2020 නොවැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - අඟුණකොළපැලැස්ස**

**මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලැබූ රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ලෙස ඇති මෙතෙක් හිමිකම් නොකියන ලද වාහන 5ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම**

අඟුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වූ නඩුවලට අදාල රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපෑ නඩු භාණ්ඩ ලෙස ඇති වාහන 05ක් 2020.12.18 වැනි දින, පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් වන වාහන පිළිබඳ හිමිකම් දක්වන්නෙකු සිටිනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය යටතේ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත වාහන මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි, එම වාහන වෙන්දේසියේ විකිණීමෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන වාහන සඳහා ඒ අවස්ථාවේ දී මුදල් ගෙවිය යුතු අතර එදිනම ප. ව. 5.00 ට පෙර අදල වාහන අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. එසේ ම සියලු ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇනවුම් කිසිවක් භාරගනු නොලැබේ.

06.වෙන්දේසියේ වාහන මිලදී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් හැඳුනුම්පතක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

මහෙස්ත්‍රාත්,
අඟුණකොළපැලැස්ස.

2020 නොවැම්බර් මස 18 වැනි දින,
අඟුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි නඩු භාණ්ඩ ලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 20771 | ලියාපදිංචි අංක LF - 3474 දරන මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව චැසි අංක LNJBCDA 148 K 200496 යනුවෙන් සඳහන් එන්ජින් අංක YZ 485QB - B7314045 යනුවෙන් සඳහන් YUEJIN වර්ගයේ ලොරි රථය | 01 |
| 02. | 28844/19 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක රහිත Dei - Dong (Govijana) වර්ගයේ අත් ට්‍රැක්ටර් රථය සහ ටේලරය (කැබලි ලෙස) | 01 |
| 03. | 27240 බී.ආර් 394/18 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක රහිත වර්ගය සඳහන් නොවන අත් ට්‍රැක්ටර් රථය සහ ටේලරය (කැබලි ලෙස) | 01 |
| 04. | 25692 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක රහිත Sun Jaary GN 12 වර්ගයේ අත් ට්‍රැක්ටර් රථය හා ටේලරය (කැබලි ලෙස) | 01 |
| 05. | 23478 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක රහිත වර්ගය සඳහන් නොවන අත් ට්‍රැක්ටර් රථය හා ටේලරය (කැබලි ලෙස) | 01 |

11-374

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සමාගමේ නම 2020.10.01 දින සිට වෙනස් කිරීම

සමාගමේ පෙර නම : එල් ඕ එල් සී ප්‍රොපටි ටෙන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 131210
සමාගමේ ලියාපදිංචි ලිපිනය : 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය
සමාගමේ නව නාමය : එල් ඕ එල් සී සිලෝන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සමාගම් ලේකම්වරු.

11-347

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සමාගමේ නම 2020.09.24 දින සිට වෙනස් කිරීම

සමාගමේ පෙර නම : කේ. ඒ. කේ. ර්. කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 00220854
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 12, නිදහස් මාවත, කොළඹ 07
සමාගමේ නව නාමය : මෙලානා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සමාගම් ලේකම්.

11-348

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය (සංශෝධිත පරිදි) යටතේ නිවේදනය කෙරෙන පරිදි ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : අයි - වොන්ඩර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : PV 00229565
ලියාපදිංචි කාර්යාලය : නො. 23/1, චිත්‍රා මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව
2020 ඔක්තෝබර් මස 24 වැනි දින සංස්ථාගත කරන ලදී.

11-367

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.